# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 24 - 2022 මාර්තු





පළතුරු පාරාදීසයක් බඳු ශ්‍රී ලංකාවට කෝටි ගණන් වටිනා ඇපල්, මිදි, ජමනාරං ආදී පළතුරු ආනයනය කිරීම ගැන පසුගිය දිනවලදී සමාජය තුල සැලකිල්ලෙන් කතාබහ කෙරීන. ගැටලුව වඩාත් තීව්‍ර බවක් ගෙන ඇති වග පෙනුනේ විදේශ විනිමය හිඟයකට රට මුහුණදී සිටිනා සමයකදී මෙවැනි දෑ සිදුවීම නිසාය. ආනයනය සාධාරණීකරණය කිරීම උදෙසා පැවසුනේ අදාළ පළතුරු රැගෙන එන්නේ සංචාරකයින්ගේ ප්‍රයෝජනයට බවයි. එසේ නමුත් රට තුල මෙම විදේශීය පළතුරු අලෙවිකෙරෙන වෙළඳසැල්, ඒවාට යනෙන පාරිභෝගිකයින් ආදිය ගැන මෙන්ම, ආනයනය කල ප්‍රමාණය පිළිබඳව විමසා බැලීමේදී වුවත් පෙනෙන්නේ එය නිවැරදි පැහැදිලිකිරීමක් නොවන බවකි. විදේශිකයින් හට ලොව සෑම රටකදීම පාහේ එවැනි පළතුරු වර්ග අනුභව කිරීමේ හැකියාව තිබෙන බැවින් අප වැඩියෙන් අවධානය යොමුකළ යුත්තේ ඔවුනට සුපුරුදු පළතුරෙන්ම සංග්‍රහ කිරීමට නොව, මෙරට මුලුගැන්වී තිබෙන දේශීය පළතුරු ප්‍රභේදයන් හඳුන්වා දීමටයි. විදේශිකයින් පමණක් නොව දේශීය තරුණ පරපුර අතර පවා අප සතු පළතුරු විවිධත්වය ගැන ඇත්තේ අල්ප අවබෝධයක් වීම අවාසනාවන්ත තත්වයකි.

දෙපාර්තමේන්තුව තුල දැනට දශක දෙකකට පමණ පෙරදී ක්‍රියාත්මකවූ ඌන භාවිත පළතුරු ව්‍යාපෘතිය හරහා මෙරට තුල තිබුන, එහෙත් අවධානයට හසුනොවූ පළතුරු ප්‍රභේද එකතුකිරීමත්, විශ්ලේෂණයත්, ගුණනය හා ක්ෂේත්‍ර මට්ටමේ සංරක්ෂණයත් සිදුකල අතර කැපීපෙනෙන ප්‍රභේදයන් නිර්දේශ කිරීමටත් කටයුතු කරන ලදී. නිර්දේශයට පසුව කලයුත්තේ මහජනතාවට අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය සැපයීමයි. මේ අනුව රජය සතු තවාන් තුල පැල නිෂ්පාදනයද ආරම්භ කරන ලදී. ගන්නොරුවේ පළතුරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සතු පැල තවාන මින් එක ස්ථානයකි. එහි ප්‍රධානී සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ චන්ද්‍රානි අබේගුණසේකර සහ තවාන් කටයුතු භාරව සිටින තාක්ෂණ සහායක රුවන් දුනුවිල යන අය තවානේ පැල තත්වය ගැන පවසනු ලැබුවේ මෙවන් අදහසකි.

**"අපි වැඩිපුරම බද්ධ පැල වශයෙන් නිෂ්පාදනය කරන්නේ දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කල පළතුරු ප්‍රභේදයන්ගේ පැල. මේ අතර ඌන භාවිත හැටියට සලකන ප්‍රභේද කීපයක්ම තිබෙනවා. උගුරැස්ස, කාමරංගා, කරවල කැබිල්ල, මසං, යනු මේවාට උදාහරණ කීපයක්. ඊට අමතරව අඹ, අලිපේර, කොස් (වරකා), ගන්නොරුව පේර, සැපදිල්ලා, දිවුල් වැනි ජනප්‍රිය ප්‍රභේදයන්ගේ පැලත් හදනවා. මේ අතරින් නිර්දේශිත ප්‍රභේදවල හැම පැලයක්ම දෙපාර්තමේන්තුවේ සහතිකකරණය යටතේ "කහ ලේබලය" ක් සහිතව තමයි අලෙවි කෙරෙන්නේ. පැලයක් රුපියල් 200 යි."**





ඔවුන්ගේ කටයුතු බද්ධ පැල නිෂ්පාදනයට පමණක් සීමා නොවේ. ජම්බු, කරවල කැබිල්ල වැනි ප්‍රභේදයන්හි අතු පැලකිරීමෙන් සාදන "අතු පැල" ද අලෙවියට තබා ඇත්තේ එකක් රුපියල් 100 ක මිලකටය. බීජ ප්‍රරෝහණය කිරීමෙන් සාදන "ඇට පැල" යනු තවත් පැල වර්ගයක් වන අතර ඒවා අලෙවි කරනුයේ රුපියල් 50 ක් වැනි අවම මුදලකටය. නිල් වෙරළු, නමිනන්, කටු අනෝදා, ඇඹරැල්ල, පීනට් බටර් ෆෲට් (Peanut Butter Fruit) යන පළතුරු ප්‍රභේදයන් මීට උදාහරණ වේ.

මහනුවර පුරවරයේ සංචාරයකට පැමිණෙන පිට පලාත්වල ජනතාව මෙම පැල තවානට පැමිණ බොහෝවිට උත්සාහ කරන්නේ ජනප්‍රිය පළතුරු ප්‍රභේදයක බද්ධ පැලයක් රැගෙන යාමටයි. අසා පුරුදු නිසා කුමන පලාතකින් පැමිණියත් ඔවුහු කර්තකොලොම්බන් අඹ ගැන විමසති. එහෙත් මෙම අඹ ප්‍රභේදය නිර්දේශ කර ඇත්තේ ප්‍රධාන වශයෙන් වියලි කලාපීය පළාත් වලටය. පහතරට තෙත් කලාපයේ ගෙවත්තක කර්තකොලොම්බන් පැලයක් සිටුවා ගැනීම බොහෝවිට හොඳ ප්‍රතිපලයක් නොලබන ආයෝජනයකි. එහෙත් පහසුවෙන් මිලදී ගතහැකි ඌන භාවිත පළතුරු පැලයක් රැගෙන යාම දක්වා අපගේ සිතිවිලි වෙනස්විය යුතු කාලය පැමිණ තිබේ. මෙම පළතුරු ප්‍රභේදයන් මෙතෙක් කලක් වනගතව ප්‍රචාරණය වූයේ සොබා දහමේ වරණීය ක්‍රියාවලියට අවනත වෙමින් සුදුස්සා තේරී ඉදිරියට යාමේ මූලධර්මය යටතේය. එනම් ඔවුන් සියල්ලෝම පරිසරය සාර්ථකව ජයගත්තෝ වූහ. රෝග පළිබෝධ තත්වයන්ට සාර්ථකව මුහුණදෙමින් හා



ජයගනිමින් පැවතීමේ හැකියාව ඔවුන් සතුව නොමඳව තිබේ. එසේනම් අපගේ පුංචි ගෙවත්ත තුලද ඔවුන් අසමත් වීමට ඉඩක් නැත. ඊට අමතරව මෙම පළතුරු ප්‍රභේදයන් බොහොමයක් ප්‍රතිඔක්සිකාරක ගුණ යනාදියෙන් පොහොසත් බැවින් ඒවා පරිභෝජනයේ අතිරේක වාසිද තිබේ. සතියේ වැඩකරන දිනයක කාර්යාලීය වේලාව තුලදී ගන්නොරුව පසුකර යන අතරතුරදී ඔබ මිලදී ගන්නා ඌන භාවිත පළතුරු පැලය, ශ්‍රී ලංකාවට උරුම පළතුරු සංස්කෘතියක් බිහිකිරීම උදෙසා කෙරෙන සම්මාදමක් වන්නේ මේ අයුරිනි. තායිලන්තය වැනි පළතුරු කර්මාන්තයේ පතාක යෝධයින් ලොවම දිනා ඇත්තේ තමාටම අයත් මෙවන් බෝග ප්‍රභේදයන් සංවර්ධනය කිරීමෙන් මිස විදෙස් පලතුරු පරිභෝජනයට ඇබ්බැහිවීමෙන් නොවේ..

**පිටපත :** සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව

**තාක්ෂණික කරුණු :** චන්ද්‍රානි අබේගුණසේකර - ප්‍රධානී/සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂිකර්ම)

පුන්‍යා දෙල්පිටිය - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)

රුවන් දුනුවිල - තාක්ෂණ සහායක

පළතුරු පර්යේෂණ හා සංවර්ධන ස්ථානය, ගන්නොරුව

**පරිගණක නිර්මාණය** : ගෝතමී ලියනගේ

**අධීක්ෂණය හා උපදෙස්** : ඩබ්.එල් හිරාන් පීරිස් (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)